**මාවනැල්ල ප්‍රාදේශීය සභාව - 2023**
**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ විනෝද බදු තැන්පතු ලෙස තබා ඇති රු.787,500 ක් ආදායමට ගෙන නොතිබුණි. | එම මුදල කඩිනමින් නිරවුල් කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. |
| (ආ) | සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව පුස්තකාල පොත්වල වටිනාකමට වඩා රු.648,014ක් අඩුවෙන් එම අගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර පුස්තකාල 03ක වූ පොත් 662ක වටිනාකම ද ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේදී සත්‍ය පොත් වටිනාකම ගලපන බව | - එම - |
| (ඇ) | කිසිදු ගිවිසුම්ගත බැඳීමක් නොතිබිය දී රු.4,000,000ක් ණයහිමියන් ලෙස වෙන්කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කරන බව. | - එම - |
| (ඇ) | 2021 වර්ෂයේ සිට භාණ්ඩ සමීක්ෂණවලින් හඳුනාගත් රු.182,999 ක ඌනතාව වගකිය යුතු නිලධාරීන්ගෙන් අයකිරීමට හෝ වෙනයම් සුදුස්සක් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | වගකිව යුතු අයගෙන් ඌනතා අය කරමි. | - එම - |
| (ඉ) | වර්ෂ 2016 - 2021 අතර කාලය තුළ ලැබිය යුතු රු.3,088,210 ක මුද්දර ගාස්තු වෙනුවෙන් ගෙවිය යුතු කාර්ය මණ්ඩල දීමනාව ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂවල දී ගිණුම් ගත කරන බව | - එම - |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 09ක මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා ඊට අදාළ අනුරූපී වාර්තා අනුව ශේෂය අතර රු.4,765,765ක වෙනසක් පැවැතිණි. | - 2024 වර්ෂයේදී නිවැරදි කරන බව. | වෙනස සැසඳිය යුතු වේ. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.27,882,783ක් වූ ජංගම නොවන වත්කම් වෙනුවෙන් උපලේඛන ඉදිරිපත් නොවුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කරන බව. | සාක්ෂි ඉදිරිපත් කළ යුතු වීම. |

**1.7 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත ------------------------ | | | |
| | I - 24 වන වගන්තිය | සභාව සතු මාර්ග 2,364 කින් මාර්ග 649 ක් පමණක් ගැසට් කිරීමට කටයුතු කර තිබුණු අතර හඳුනා නොගත් මාර්ග සංඛ්‍යාව හඳුනා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | සියලු මාර්ග ගැසට් කිරීම සඳහා ලේඛන සම්පූර්ණ කර ඇති බව හා හඳුනා නොගත් මාර්ග හඳුනා ගෙන ඉන්වෙන්ට්‍රිගත කරන බව. | පනත ප්‍රකාර කටයුතු කළයුතු වේ. |
| | 158 වගන්තිය | මාර්ග 15 ක බදුකරුවන් 797 දෙනෙකුගෙන් හිඟහිට් රු.3,703,229 ක් වර්ෂ 03 ත් වර්ෂ 30 ත් අතර කාලයක් පැරණි විය. | හිඟ වරිපනම් සඳහා දේපළ තහනම් කරන බවත්, හිඟ අක්කර බදු සඳහා දේපල සතොයක්ෂණයක් සිදු කරන බව. | - එම - |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්තික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 371 (2)(ඇ) | වසර 02 ත් වසර 24 අතර කාලයක් පැරණි රු.375,632ක අත්තිකාරම් 2023 වර්ෂය අවසාන වන විටත් පියවා නොතිබුණි. | 2024 වර්ෂය අවසානයට පෙර නිරවුල් කරන බව | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. |
| | (ii) මුදල් රෙගුලාසි 571(3) | වර්ෂ 03කට වඩා පැරණි ගෙවිය යුතු මිශ්‍ර , ජල සේවා, රංග ශාලා තැන්පත් හා කර්මාන්ත ගිවිසුම් ඇප තැන්පත් රු. 1,727,212 ක් ආදායමට ගෙන නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට පෙර නිරවුල් කරන බව | - එම - |
| (ඇ) | 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | 2017 වර්ෂයේ සිට අක්‍රියව පැවැති රු.22,786,422 ක් වූ සභාව සතු වාහන 05 ක් සහ යන්ත්‍රයක් අපහරණය කර නොතිබුණි. | සභාව සතු වාහන සියල්ල හඳුනාගෙන අපහරණ කටයුතු සිදු කරන බව. | චක්‍රලේඛ පරිදි කටයුතු කළයුතු වේ. |
| (ඈ) | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන | වසර 5කට වරක් සිදුකළ යුතු වරිපනම් තක්සේරුව 2009 වර්ෂයෙන් පසුව සිදු | නව තක්සේරුවට අදාළ දේපළ මැනීම් ආරම්භ කර ඇති බව. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | කොමසාරිස් චක්‍රලේඛයේ 2 ඡේදය | නොකිරීම නිසා නව තක්සේරුවකින් ලබාගත හැකි ආදායමක් අහිමි වී තිබුණි. | | |
| (ඉ) | අංක 8/2010 දරන පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛය 5 ඡේදය | බෙහෙවින් නාගරීකරණය වී ඇති ප්‍රදේශ හඳුනාගෙන මලපවහන සැලැසුමක් සකස්කර නොතිබුණි. | ඉදිරියේදී විධිමත් සැලසුමක් සකස් කිරීමට නිලධාරීන් දැනුවත් කරන බව | - එම - |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 56,347,746 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 52,521,177 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැ.31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැ.31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 15,972,463 | 14,522,224 | 19,000,551 | 13,646,172 | 16,176,590 | 13,181,823 | 11,900,439 | 14,009,150 |
| කුලී | 51,898,279 | 36,868,961 | 31,733,747 | 11,163,365 | 38,110,150 | 33,994,565 | 32,114,790 | 19,189,954 |
| බලපත්‍ර ගාස්තු | 5,875,500 | 2,401,395 | 2,158,269 | 4,916,278 | 4,260,300 | 4,303,669 | 2,645,739 | 3,875,698 |
| වෙනත් ආදායම් | 29,379,000 | 30,713,688 | 10,405,778 | 15,918,578 | 21,713,500 | 16,408,056 | 11,877,377 | 394,992 |
| එකතුව | **103,125,242** | **84,506,268** | **63,298,345** | **45,644,393** | **80,260,540** | **67,888,113** | **58,538,345** | **37,469,794** |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් බදු 797 කින් රු.3,703,228ක හිඟය වර්ෂ 03 ක් හා වර්ෂ 30 ක් අතර කාලයක් පැරණි විය. | දේපළ තහනම් කිරීම මේ වන විට අදියර වශයෙන් සිදු කරන බව | හිඟ ආදායම් නොපමාව අය කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම්, කුලී, උසාවි දඩ හා මුද්දර ගාස්තු ශේෂය රු.107,320,929ක් වූ අතර ඒ තුළ වර්ෂ 05කට වඩා පැරණි රු.10,040,665ක ශේෂයක් පැවැතිණි. | හිඟහිටි ශේෂ අයකර ගැනීමට කටයුතු කරන බව | - එම - |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන වීථි ලාම්පු සවිකර තිබුණු අතර සවිකළ සංඛ්‍යාව ද විගණනය වෙත ඉදිරිපත් නොවුණි. | ඉදිරියට ඒ අනුව කටයුතු කරන බව. | චක්‍රලේඛ පරිදි කටයුතු කළ යුතු වේ. |
| (ආ) | පොදු කටයුතු සඳහා වෙන් කළ රූඩ් 08 පර්චස් 36ක බිම් කොටස් 02ක් මේ දක්වා පවරා ගෙන නොතිබුණි. | පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. | වත්කම්වල අයිතිය නිරවුල් විය යුතු වේ. |
| (ඇ) | 2023 වර්ෂය සඳහා කඩ කාමර 12ක් ද, වෙළඳ අයිතිය බදුදීම් 10ක් ද වෙනුවෙන් තෙවන වරටත් ටෙන්ඩර් ඉදිරිපත් නොවීම නිසා රු.9,038,913ක ආදායමක් අහිමි වී තිබුණි. | අවම ලංසුව සංශෝධනය කර අනුමැතිය ලබා ගන්නා බව | ආදායම් නොපමාව රැස්කළ යුතු වේ. |
| (ඈ) | කඩ කාමරවලින් සහ වෙළඳ අයිතිය බදු දුන් ටෙන්ඩර් කරුවන්ගෙන් 2002 සිට 2018 දක්වා කාලය තුළ හිඟහිටි රු.173,723 ක් අයකර නොතිබුණි. එමෙන්ම, 2020-2021 කාලයට අදාළ රු.6,529,521 ක් කපා හැරීමට සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කර තිබුණි. | මේ සඳහා සිදු කරන මූලික විමර්ශනය අනුව කටයුතු කරන බවත්, 2020 හා 2021 වර්ෂවල හිඟ හා දඩ කපා හැරීමට ආණ්ඩුකාර අනුමැතිය ලද බව. | - එම - |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉදි කිරීමට අපේක්ෂා කළ හෙම්මාතගම සාප්පු සංකීර්ණයේ ලැබිය යුතු පෙර ගෙවුම් (key money) ලෙස ගිණුම්ගත කර තිබුණු රු.1,607,774ක් වර්ෂ 22කට වඩා පැරණි විය. | එම ඉදිකිරීම් අතරමඟ නැවතී ඇති බවත් සිදු කරන ලද ඉදිකිරීම් ද අබලන් තත්වයට පත් ඇති බවත්. | ඉදිකිරීම් සිදුකර ආදායම් උපයාගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මාවනැල්ල බස් නැවතුම්පල අසළ පර්චස් 1.12 භූමියක ඉදි කරමින් පවතින දෙමහල් අනවසර ගොඩනැගිල්ල ඉවත් කිරීමට මේ දක්වාම කටයුතු කර නොතිබුණි. | සැලැස්ම සභාපතිතුමා විසින් අනුමත කර ඇත. ලිඛිතව දැනුම් දුන්නද මෙය ඉවත් නොකරන නිසා එය නියමානුකූල කිරීමට, නිර්වන්දි ගිවිසුමකට එළැඹී බවත්, මේ සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පරීක්ෂණයක් පවත්වන බව. | අදාළ පනත් ප්‍රකාරව ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | සභාව සතු මාර්ග 2364 කින් මාර්ග 1715 ක් ගැසට් කර නොතිබුණි. | සභාව සතු මාර්ග ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන බව. | - එම - |
| (ඈ) | 2023 වර්ෂය අවසානයට ලැබිය යුතු රු.4,126,606 ක් වර්ෂ 3 ක් පැරණි වූ අතර රු.455,454ක ශේෂය වර්ෂ 5කට වඩා පැරණි විය. | එම ශේෂ කපා හැරීමට කටයුතු කරන බවත් වසර 03ක් පැරණි හිඟ කඩකුලී වෙනුවෙන් මූලික විමර්ශනයක් සිදු වන බවත්. | ලැබිය යුතු ශේෂ නිරවුල් කළ යුතු වේ. |
| (ඉ) | ගෙවියයුතු කර්මාන්ත හා විවිධ ණයහිමි ශේෂවල එකතුව රු. 17,800,070 ක් වූ අතර ඉන් රු.959,000 ක් වර්ෂ 3ක් ඉක්මවූ ශේෂ විය. | එම පාර්ශව දැනුවත් කර ගෙවීම් කිරීම හෝ ආදායමට ගැනීමට කටයුතු කරන බව | ණයහිමි ශේෂ නිරවුල් කළ යුතුවේ. |

**3.3 මානව සම්පත් කළමණාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත සේවක සංඛ්‍යාවෙන් 13 දෙනෙකුගේ අතිරික්තයක් සහ පුරප්පාඩු 21ක් පැවැති අතර සේවකයින් 04 දෙනෙකුට ස්ථිර තනතුරට අදාළ නොවන වෙනත් කටයුතු පවරා තිබුණි. | පුරප්පාඩු පිරවීම ප්‍රධාන අමාත්‍යාංශය මගින් සිදුවන බවත්, වෙනත් කටයුතු පවරා ඇති සේවකයින් 4 දෙනා නිශ්චිතව හඳුනාගත නොහැකි බැවින් නිවැරදි පිළිතුරක් ලබා දීමට නොහැකි බව. | පුරප්පාඩු සම්පූර්ණ කර අතිරික්ත සේවකයින් වෙනත් ආයතන වෙත මුදාහැරීමට කටයුතු කළ යුතුවේ. |

**3.4 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාහන හා යන්ත්‍ර 08 ක් සඳහා වෙනත් තනතුරුවල සේවකයන් රියදුරන් ලෙස යොදවා තිබුණි. | ප්‍රමාණවත් රියදුරු සංඛ්‍යාවක් නොමැති වීම. | ස්ථිර රියැදුරන් අනුයුක්ත කරගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අභාවිත සහතිකයක් නොගැනීම නිසා 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වාම අභාවිතව පවතින වාහන 04ක් සඳහා ආදායම් බලපත්‍ර හා රක්ෂණය වෙනුවෙන් රු.171,085ක් නිෂ්කාර්යව වැයකර තිබුණි. | නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් වී නොමැති බැවින් මෙම නිශ්කාර්ය වැය සිදුකර ඇති අතර මේ වන විට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව. | අභාවිත සහතික ලබා ගත යුතු වේ. |
| (ඇ) | කම්පැක්ටර් වේලරය, කොම්පෝස්ට් අංගනයට ධාවනය කිරීම සඳහා වූ මාර්ගය සුදුසු නොවීම හේතුවෙන් ලද දින සිට වර්ෂ 06ක කාලයක් තිස්සේ නිෂ්කාර්යව පවතී. | පවරා දීමට මේ දක්වාම ආයතනයක් ඉදිරිපත් වී නොමැති බව | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |